**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------------------------

ශ්‍රී ලංකා රේගුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථීක තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) මෙම වාර්තාවේ 1.6.3 (අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**(අ) හිඟ ආදායම්**

ශ්‍රී ලංකා රේගුවේ හිඟ ආදායම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් සංකේත 9 ක හිඟ ආදායම් 2019 දෙසැම්බර් 31 දිනට ශේෂයන් හා 2020 ජනවාරි 01 දිනට ශේෂයන් අතර රු.43,355,433,032 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයට ප්‍රතිශතාත්මකව සියයට 258 ක සංශෝධන ඇතුලත් කර තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2020 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාලව හඳුන්වා දී ඇති හිඟ ආදායම් වාර්තා කිරීමේ ආකෘතිය ACA 1(i) අනුව වර්ෂය ආරම්භක හිඟ ආදායම, වර්ෂය ඇතුලත වාර්තාවූ හිඟ ආදායම්, වර්ෂය තුල අයකල හිඟ ආදායම් හා වර්ෂ අවසානයේ ශේෂ දැක්වීම සඳහා තීරු හඳුන්වා දී ඇතත් පෙර වර්ෂයට අදාල හිඟ ආදායම් හෝ වෙනත් අගයන් ගැලපීම සඳහා ඉඩකඩ සලසා නොමැත. කෙසේ වුවද හිග බදු අයකිරීමට අදාල වාර්තා පවත්වාගෙන යන දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ විසින් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට වාර්තා කර තිබූ අගය ද නිවැරදි නොවේ. එය ඉහත ආකෘති පත්‍රයේ සඳහන් ලෙසට සංශෝධනය විය යුතු බවට 2020 වර්ෂය තුල හඳුනාගෙන තිබුණි. එබැවින් මෙසේ හඳුනාගත් හිඟ බදු මුදල් 2020 වර්ෂයේ ආරම්භක ශේෂයට ගලපා ඇත. ඒ අනුව 2020 වර්ෂයේ ආරම්භක ශේෂය සකස් වූ ආකාරය දැක්වෙන සැසඳීම් ප්‍රකාශය "ඇමුණුම 1" ලෙස ඉදිරිපත් කර ඇත. | හිඟ ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු වීම. |

**(ආ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වැය ලෙජරය අනුව 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වලට අදාල | 2020.12.31 දිනට වැය ලෙජරය අනුව 2103 වැය විෂයය යටතේ මුළු වියදම රු.24,785,470 කි. මූල්‍ය ප්‍රකාශන වල | නිවැරදිව තොරතුරු ගිණුම්වල වාර්තා කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මුළු වියදම රු.22,826,946 ක් වුවද, මූල්‍ය ප්‍රකාශවල එය රු.24,492,302 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 1,665,356 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඇතුලත් වියදම රු.24,492,302 කි. ඒ අනුව, වෙනස රු.1,706,832 කි. හම්බන්තොට වරාය රේගු නිලධාරීන්ගේ නේවාසිකාගාර 4 ක් සඳහා වායුසමීකරණ සවි කිරීම වෙනුවෙන් මෙම වියදම දරා ඇති අතර හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2020 දෙසැම්බර් මාසික ගිණුම් සාරාංශය මඟින් එම වියදම වාර්තා කර ඇත. | |
| **(ii)** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 82) අනුව සමාලෝචිත වර්ෂය තුල මිලදී ගැනීම්වල එකතුව රු.32,254,378 ක් වුවද වැය ලෙජර අනුව එය රු.40,461,613 ක් වීමෙන් රු.8,207,235 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම යටතට අයත් වන්නේ වැය විෂයය අංක 2102 සහ 2103 යටතේ දරන ලද වියදම් වේ. විගණනයේ ගණනය කිරීම් සඳහා 2401 (පුහුණු සහ හැකියා වර්ධන) වැය විෂයය සහ 2002 (යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා) වැය විෂයය යටතේ දරන ලද වියදම් ද ඇතුලත් කර ඇත. එම වටිනාකම අඩු කිරීමෙන් පසුව 2102 සහ 2103 වැය විෂයය යටතේ මුළු වියදම රු.32,263,278 ක් වන අතර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුල මිලදී ගැනීම් වල එකතුව රු.32,254,378 කි. ඒ අනුව වෙනස රු.8,900 කි. CIGAS ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2020.11.18 දින මිලදී ගන්නා ලද රු.8,900 ක් වටිනා ඇඹරුම් යන්ත්‍රය (Blender) විදුලි උපාංග යටතේ වන මුළු එකතුවට ඇතුලත් වී නොමැති වීම හේතුවෙන් මෙම වෙනස පෙන්නුම් කර තිබේ. එය CIGAS වැඩසටහනේ තාක්ෂණික දෝෂයක් මත සිදු වී ඇති බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට නිවැරදි කිරීමට අදාල ගැළපුම් කඩිනමින් සිදු කල යුතු වීම. |
| **(iii)** | අංක 2102 දරන කාර්යාල උපකරණ වැය ලෙජරය වන 2102 යටතේ දැක්විය යුතු රු.22,473,930 ක් වටිනා කාර්යාල උපකරණ අංක 2103 දරන පිරියත හා යන්ත්‍රෝපකරණ ශේෂය තුළ ඇතුළත්ව තිබුණි. | වවුචර් සඳහා ගෙවීම් සිදු කිරීමේදී අවස්ථානුකූලව අදාල වැය විෂයයන්ට හර කිරීම් සිදු කරනු ලබන අතර විගණනය විසින් අදාල තොරතුරු ලබා දෙන්නේ නම් නැවත පරීක්ෂා කර බලා පිළිතුරු ලබා දිය හැකි වේ. | නිවැරදි වැය විෂයයන්හි වියදම් සටහන් කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | 2020 දෙසැම්බර් 31 දිනට වැය විෂයය අංක 2002 දරන ස්ථාවර වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැය විෂයය යටතේ වූ මුළු වියදම රු.2,292,598 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශ සමඟ වූ ඒසීඒ 2(1) ප්‍රකාශයේ රු.3,712,414 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,419,816 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2020.12.31 දිනට 2002 වැය විෂයය යටතේ දරන ලද වියදම රු.3,712,414 කි. එම වටිනාකම වැය ලෙජරයේ මෙන්ම මූල්‍ය ප්‍රකාශන වලද දක්වා ඇත. ඒ අනුව වෙනසක් නොමැත. | වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන තොරතුරු නිවැරදි විය යුතු වීම. |

## 1.6.2 තැන්පතු ලැබීම් හා ගෙවීම්

--------------------------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම්වලට අදාලව ඉදිරිපත් කර තිබූ ඒසීඒ 4 ප්‍රකාශනය අනුව පැවති ශේෂයන් හා 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඒසීඒ 4 ප්‍රකාශනයේ පැවති ආරම්භක ශේෂයන් අතර රු.101,917,351 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී පාදක කොට ගෙන ඇත්තේ භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂයන් වන අතර 2020 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී පාදක කොට ගෙන ඇත්තේ දෙපාර්තමේන්තු ලෙජරයෙහි සඳහන් ශේෂයන් වේ. ඒ අනුව මෙම වෙනස ඇති වී ඇත.කෙසේ වුවද මෙය වර්ෂ කිහිපයක සිටම ආරම්භක ශේෂයේ පැවත එන වෙනසකි. | දිගු කාලයක සිට ගිණුම්වල දැක්වෙන මෙම වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කල යුතු වීම. |
| (ආ) | තැන්පතු ගිණුම්වලට අදාලව භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ දක්වා ඇති හර හා බැර කිරීම් දෙපාර්තමේන්තු පොත් සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.30,755,216 ක වෙනසක් හා රු.1,537,785 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | හර කිරීම්වල වෙනසට හේතුව<br>----------------------------------<br>(i) රු.1,537,785 ක මුදල ගුවන් මඟින් රැගෙන එන භාණ්ඩ සඳහා අයකරනු ලබන තැන්පත් (6000/0000/00/0001/0035/000) 18/128 දරන ගිණුමට බැර විය යුතු නමුත් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමේදී වැරදීමකින් 1/35 ගිණුමට බැර කර ඇති මෙම අගය 2020 වර්ෂයේ දෙසැම්බර් මස දී J/20/12/12X ජර්නලය මඟින් නිවැරදි කිරීම මත මෙම වෙනස ඇතිවී ඇත. | භාණ්ඩාගාර සටහන්වල දත්ත හා දෙපාර්තමේන්තු පොත්වල දත්ත අතර ගැලපීමක් ඇති වන ගිණුම් සැකසිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | (ii) රු.481,876 ක මුදල ටෙන්ඩර් තැන්පත් ගිණුමට (6000/0000/02/0186/000) 2020 මැයි හා සැප්තැම්බර් මාසයන්හි වැරදීමකින් හර කර තිබූ මුදලකි.<br><br>(iii) රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට (6000/0000/00/0006/0062/000) දෙපාර්තමේන්තු පොත් අනුව හර කිරීම් එකතුව රු.1,297,069,865 ක් ලෙස නිවැරදි විය යුතු අතර වෙනස රු.28,735,576 ලෙස නිවැරදි විය යුතුය. ඒ අනුව ඉහත බැර කිරීම්වල දක්වා ඇති ජර්නල් සටහන් සහ පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම මත වූ ජර්නල් සටහන් නිසා මෙම වෙනස ඇතිවී ඇත.<br><br>බැර කිරීම්වල වෙනසට හේතුව<br>------------------------------------<br><br>රු.1,537,785 ක මුදල ගුවන් මඟින් රැගෙන එන භාණ්ඩ සඳහා අයකරනු ලබන තැන්පත් (6000/0000/00/0001/0035/000) 18/128 දරන ගිණුමට බැර විය යුතු නමුත් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමේදී වැරදීමකින් 1/35 ගිණුමට බැර වීම මත මෙම වෙනස ඇතිවී ඇත. | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වලට අදාළව දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල පැවති ගිණුම් ශේෂයන් 04 ක රු.93,229,983 ක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම්වලට හේතු සඳහන් කරමින් සැසඳුම් ප්‍රකාශනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 18/128 ගිණුමට බැර විය යුතු නමුත් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමේදී වැරදීමකින් 1/35 ගිණුමට බැර කර ඇති මෙම අගය 2020 වර්ෂයේ දෙසැම්බර් මස දී J/20/12/12X ජර්නලය මගින් නිවැරදි කිරීම මත මෙම වෙනස ඇතිවී ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතු අතර අනාගතයේදී මෙවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2399 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,925,498,453 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,014,489,891 ක්ද වශයෙන් එකතුව රු.2,939,988,344 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කල බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලවල, වරාය හා ගුවන්තොටුපල ආදී ස්ථානවල අදාළ අංශභාර අධීක්ෂණ නිලධාරියෙකුගේ සහතික කිරීම් මත අතිකාල ගෙවීම් සිදුකර ඇත. තවද, මෙම ඇඟිලි සලකුණු තැබීම සම්බන්ධව වාර්තාවක් 2021.04.06 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) වෙත ඉදිරිපත් කර ඇත. | (i) රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම්කාරක සභා නියෝග පිළිපැදිම දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු වීම.<br>(ii) මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීම.<br>(iii) සේවක කළමනාකරණය හා සම්බන්ධව පවතින සතුටුදායක නොවුණු අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම. |
| (ආ) ශ්‍රී ලංකා රේගුව විසින් අවශ්‍යතාවය ඉක්මවා මිලදී ගෙන තිබුණ පාවහන් යුගල 1939 ක් වෙනුවෙන් රු.6,357,982 ක් ද මේස් යුගල 3412 ක් වෙනුවෙන් රු.853,000 ක් ද වශයෙන් එකතුව රු.7,210,982 ක් රජයේ අරමුදල්වලින් වැය කර තිබුණ ද මෙම පාවහන් හා මේස් ගබඩාවට ලැබුණ බව හෝ ගබඩාවෙන් නිකුත් කළ බව තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | මාගේ අංක ESD/GE/03/01/2021 හා 2021.05.04 දිනැති විගණන විමසුමේ 03 (ඇ), (ඈ) සහ 03. පාවහන් හා මේස් නිකුත් කිරීමට අදාළ ගබඩා කාර්ය පටිපාටිය මඟින් මේ සම්බන්ධව පිළිතුරු සපයා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි මිලදී ගැනීම සිදු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂය තුළදී ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට ඉදිරිපත් කර තිබූ භාණ්ඩවල වටිනාකම තක්සේරු කළ ආකාරය දැක්වෙන ලිඛිත සාක්ෂි කිසිවක් අදාල අංශය තුළ නොවිණි. ඒ අනුව අදාල බදු මුදල් ගණනය කිරීම්වල නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. | මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර් කැඳවීම මඟින් විකිණීමට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ සඳහා වටිනාකම තක්සේරු කරනුයේ රේගු මිල පිරික්සුම් අංශයෙනි. මිල පිරික්සුම් අංශයේ තක්සේරුකරුවන්ගේ පරීක්ෂාව සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීම මධ්‍යම අපහරණ අංශය විසින් සිදු කරනු ලබන අතර, රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව එම මිල නියම කල ආකාරය පිළිබඳ විස්තර සියල්ලම මිල පිරික්සුම් අංශය භාරයේ පවතී. එක් එක් අයිතමයන් සඳහා අදාළ මිල ගණන් නියමකල පසුව මුද්‍රා තබන ලද රේගු තක්සේරු වාර්තා ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යම අපහරණ අංශය වෙත එවීම මිල පිරික්සුම් අංශය විසින් සිදු කෙරේ.<br><br>රේගු ටෙන්ඩරයේ දී අදාළ අයිතමයන් ප්‍රදානය වන්නේ රේගු තක්සේරු අගය ඉක්මවා ඉහලම ලංසුව ඉදිරිපත් කරනු ලබන ගැනුම්කරුට වන බැවින්, රජයට අයවිය යුතු බදු මුදල් ගණනය කිරීම සිදු වනුයේ රේගු තක්සේරු අගය මත නොව, අදාළ ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පදනම් කර ගනිමිනි. එසේ හෙයින් ටෙන්ඩරය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ඉහළම ලංසුකරු තෝරා ගැනීමේ කාර්යය සඳහා මිස බදු මුදල් ගණනය කිරීම සඳහා රේගු තක්සේරු මිල සැලකිල්ලට නොගන්නා බව වැඩිදුරටත් සඳහන් කරමි.<br><br>ලංසුකරුවන් විසින් එක් එක් අයිතමයන් සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන්, අයිතමය ප්‍රදානය කරන ලද මිල, ඊට අදාළව අයකර ගත් බදු මුදලේ ප්‍රමාණය ආදී වාර්තා සියල්ල මධ්‍යම අපහරණ අංශය සතුව පවතී. | දෙපාර්තමේන්තු නියෝග 790 ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ මුදලින් රු.20,321,912 ක්ද, වැරදි නිවැරදි කිරීම් ලෙස රු.94,819,272 ක්ද, ආදායමින් ආපසු ගෙවීම් ලෙස සිදු කර තිබුණ ද එම ගෙවීම් තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ආදායමෙන් ආපසු ගෙවීමේ ලේඛනය සහ වැරදි නිවැරදි කිරීම්වලට අදාළ ජ”නල් සටහන් ලේඛනය පවත්වාගෙන යන අතර විගණනය සඳහා ඉදිරිපත් කළ හැක. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි නිසි පරිදි විගණනය සඳහා ඉදිරිපත් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නියමිත බදුගෙවා බැංකු ඇපකර නිදහස් කර ගැනීමට කටයුතු නොකර රු.5,561,829 ක් පැවති අතර එම කාලපරිච්ඡේදය තුළ බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර ගැනීමට ලියාපදිංචි වූ සංඛ්‍යාව හා නිදහස් කර ගැනීමට කටයුතු කළ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | දැනට කාර්යාලයේ පවතින වාර්තා වලට අනුව 2005 වසරට අදාළව වලංගු බැංකු ඇපකර 02ක් හා 2007 වසරට අදාළව වලංගු බැංකු ඇපකර 02 ක් පවතී. එහි ඇතුළත් අංක 2005/66 දරණ බැංකු ඇපකර සඳහා දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවතින අතර, අංක 2007/66 i, හා 2007/66 ii දරන ඇපකර සඳහා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ඉල්ලුම්පත් අංක 68/2016 යටතේ නඩු කටයුතු පවතී. | බැංකු ඇපකර ලබා ගැනීමේදී හා නිදහස් කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්විය යුතු බව. |
| (ඊ) | 2015 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා වූ වසර 04 ½ ක් වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුව විසින් රේගු විමර්ශන තුළින් රු.33,845,962,239 ක් වූ සමස්ත ආදායමක් රැස්කර තිබුණි. එහෙත් ඒවාට ඇතුළත් දණ්ඩන ආදායම, විකුණුම් ආදායම, රාජසන්තක කිරීමේ ආදායම හෝ තීරු බදු හා අනෙකුත් ආදායම් තීරණය කිරීමට පාදක කරගන්නා වූ භාණ්ඩවල වටිනාකම, එම වටිනාකම් තීරණය කළ ආකාරය හා අහිමි වූ තීරු බදු ආදායම යනාදිය තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි ශ්‍රී ලංකා රේගුවේ කිසිදු අංශයකින් විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ සම්බන්ධව සොයාබලා කරුණු ඉදිරිපත් කිරීමට සටහන් කර ඇත. | විධිමත් පරීක්ෂාවක් කල හැකි පරිදි වාර්තා ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත ආදායම සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී අපනයන බදු ආදායම රු.13,653,027 කින් හෙවත් සියයට 12 කින් ද ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම රු.11,888,924,706 කින් හෙවත් සියයට 18 කින් ද අඩු වී තිබුණි. Covid 19 වසංගත තත්ත්වය මේ සඳහා හේතු වී ඇති බව වාර්තා වී තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදිය. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආනයන බදු අනුපාත අඩුවීම හා ආනයන සීමා කිරීම හේතුකොටගෙන ආනයන බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.25,817,407,597 කින් අඩු වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 18 ක පහළ යාමකි. තවද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ ආදායමට වඩා සත්‍ය ආදායම සියයට 16 කින් පහළ ගොස් තිබූ අතර එම වටිනාකම රු.15,291,047,032 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම- |
| (ඇ) | වාහන ආනයන සීමා කිරීම නිසා වාහන හිමිකම් මත අයබදු සත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 51 ක පහළ යාමක් නිරීක්ෂණය වූ අතර විචලනයේ පහළ යාම රු.742,478,146 ක් විය. බදු ආදායම අඩු වීම මීට බලපා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම- |
| (ඈ) | දඩ මුදල් හා රාජසන්තක කිරීම්වලින් රු. 4,800,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණ ද සත්‍ය ආදායම රු.2,889,218,648 ක් වුයෙන් සියයට 40 ක පහළ යාමක් හෙවත් රු. 1,910,781,352 ක ඌණතාවයක් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම- |

### 2.1.2 පූර්ව වර්ෂයේ ආදායම සමඟ සැසඳීම

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ සමස්ථ බදු ආදායමින් සියයට 0.2 ක් එනම් රු. 96,346,973 ක් අපනයන බදු ආදායම් සංකේතය යටතේ රැස් කරගෙන තිබූ අතර ඉකුත් වර්ෂයේදී එකතු කළ ආදායම රු. 170,442,852 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අපනයන බදු ආදායම රු.74,095,879 කින් හෙවත් සියයට 43.47 කින් අඩු වී තිබුණි. | 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුල අපනයන ප්‍රමාණයන්හි විශාල අඩුවීමක් දක්නට ඇත. මෙය අපනයන බදු ප්‍රමාණය මෙන්ම අපනයන සෙස් බදු ප්‍රමාණය පහත වැටීමට සෘජු ලෙස හේතු වී ඇත. කොරෝනා තත්ත්වය හමුවේ ඇති වූ අපනයන අඩුවීම නිසා මෙම තත්ත්වය ඇති විය. විගණන නිරීක්ෂණ නිවැරදිය. | වඩාත් ප්‍රශස්ථ ලෙස ප්‍රමාණාත්මක ආදායම් වර්ධනයක් ලැබෙන පරිදි කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ආනයන සෙස් බදු ආදායම් සංකේතය යටතේ රු.47,295,124,841 ක ආදායමක් රැස්කරගෙන තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් සංකේතය යටතේ රැස්කළ ආදායම රු. 48,403,019,454 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 1,107,894,613 කින් හෙවත් සියයට 2.29 කින් අඩු වී තිබුණි. | 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුළ<br>(අ) ආනයනය කළ ප්‍රමාණය විශාල ලෙස පහත වැටී ඇත. විගණන නිරීක්ෂණ නිවැරදිය.<br>(ආ)භාණ්ඩ විශාල සංඛ්‍යාවක් තාවකාලික සීමා කිරීමකට ලක් වී ඇත. (Temporary Suspended) ඒ හේතුවෙන් ආනයන සෙස් බද්ද සාපේක්ෂව පහත වැටී ඇත. විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම - |
| (ඇ) | අපනයන සෙස් බදු ආදායම් සංකේතය යටතේ රු. 2,013,974,216 ක ආදායමක් එකතු කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් සංකේතය යටතේ එකතු කර තිබූ ආදායම රු.2,299,688,371 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 285,714,155 කින් හෙවත් සියයට 12.42 කින් අඩු වී තිබුණි. | -එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ මුළු ආදායම වන රු.566,462,925,975 න් රු.53,111,075,294 ක් හෙවත් සියයට 16.67 ක් නියෝජනය කරන ඛනිජ තෙල් නිෂ්පාදන බද්ද පෙර වර්ෂයට වඩා රු. 8,629,228,352 කින් හෙවත් සියයට 13.98 කින් අඩු වී තිබුණි. | ඛනිජ තෙල් නිෂ්පාදන බද්ද පහත වැටීමට ප්‍රධාන හේතු 2020 වර්ෂය තුළ සාපේක්ෂ වශයෙන් ඛනිජ තෙල් ආනයනික ප්‍රමාණය පහත වැටීමය. කොරෝනා තත්ත්වය හමුවේ ඉන්ධන ආනයන සීමා වීම නිසා මෙම තත්ත්වය ඇති විය. විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම- |
| (ඉ) | මෝටර් වාහන නිෂ්පාදන බදු ලෙස රු.48,759,937,998 ක ආදායමක් රැස්කර තිබූ අතර ඉකුත් වර්ෂයේ රැස්කළ ආදායම රු. 130,377,881,902 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 81,617,943,904 කින් හෙවත් සියයට 62.6 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. | මෝටර් රථ වාහන ආනයන මත පැනවූ ආනයන සීමා කිරීම (Temporary Suspended) හේතුවෙන් 2020 වර්ෂයේ මාර්තු සිට මේ දක්වාම මෝටර් රථ ආනයන සිදු නොවීම මත එමඟින් ලැබෙන මෝටර් රථ නිෂ්පාදන බද්ද විශාල ලෙස පහත වැටී ඇත. . විගණන නිරීක්ෂණ නිවැරදිය. | -එම- |

**2.1.3 හිඟ බදු ආදායම්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු වටිනාකමින් රු.22,798,404,254 ක් හෙවත් සියයට 36 ක් නියෝජනය කරනු ලබන්නේ ආනයන හිඟ බදු වේ. එයින්ද රු. 6,370,798,202 ක් 2017 වර්ෂයේ සිට පැවති ඒවා වේ. | ඔබගේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. | රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ බදු ආදායමින් රු.16,082,423,443 ක් හෙවත් සියයට 25 ක් නියෝජනය කරනු ලබන්නේ විශේෂ වෙළඳ භාන්ඩ බදු වලිනි. එයින් රු. 4,488,152,878 ක් 2017 වර්ෂයේ සිට හිඟ හිටි ආදායම් වන අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය නොවී පැවතුණි. | -එම- | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. |
| (ඇ) | 2011 වර්ෂයේදී අහෝසි කරන ලද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද මගින් 2011 දෙසැම්බර් 31 දිනට රු.108,659,190 ක හිඟ බදු ආදායමක් අයවීමට තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකම අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.3,233,204,301 ක් වූ ඛණිජ තෙල් නිෂ්පාදන හිඟ බදු ආදායම සමස්ථ හිඟ බදු අදායමින් සියයට 5 ක් නියෝජනය කරනු ලබයි. | අත්‍යාවශ්‍ය සේවා සඳහා රජයේ ආයතන සඳහා ණයට ලබාගත් ඉන්ධන සඳහා අයකල යුතු මුදල් වන අතර, 2020 වර්ෂය තුලදී රු.11,193,111,605 මුදලක් පියවා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. |
| (ඉ) | හිඟ බදු ආදායමෙන් රු.10,275,489,817 ක් එනම් සියයට 16 ක් නිරූපනය වන්නේ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු මුදලින් වන අතර එයින් ද රු.2,868,111,695 ක් 2017 වර්ෂයේ සිට හිඟ හිටි ආදායම් වේ. තවද 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු. 6,152,560,946 ක් හෙවත් සියයට 9.69 ක් නියෝජනය කරන ආනයන සෙස් බදු මුදලින් වන අතර එයින් රු.1,716,039,908 ක් 2017 වර්ෂයේ සිට අය නොවී පැවතුණි. | ඔබගේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. | -එම- |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු. 4,711,376,538 ක් හෙවත් සියයට 7 ක් නිරූපණය වන්නේ නිෂ්පාදන විශේෂ විධි විධාන මෝටර් රථ වාහන බදු වටිනාකමෙන් වන අතර එයින් රු.1,314,930,120 ක් 2017 වර්ෂයේ සිට හිඟව පැවතුණි. | ඔබගේ නිරීක්ෂණ සමග එකඟ වෙමි.<br>විවිධ අවශ්‍යතාවයන් පදනම් කරගෙන මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව රේගු බදු පසුව ගෙවීමේ පදනම මත රජයේ අමාත්‍යාංශ හා අනිකුත් අනුබද්ධ ආයතන වෙත භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා වසර ගණනාවකට පෙර සිට දෙන ලද සහනදායී වැඩ පිළිවෙලක ප්‍රතිඵලයක් ලෙස මෙම රේගු ගාස්තු හිඟ හිට ඇත. මෙම හිඟ මුදල් නිරවුල් කර ගැනීම සඳහා එක් එක් ආයතනවල හිඟ මුදලට අදාල තොරතුරු එම ආයතන වෙත ලබාදී ඇත. රේගු ප්‍රකාශන අංශය වෙතින් ආනයන භාණ්ඩ සම්බන්ධ තොරතුරු ලබාගෙන එම ආයතන වෙත දිගින් දිගටම දැනුම් දීමට කටයුතු කර ඇත.<br><br>2020 වර්ෂය තුලදී හිඟ රේගු බදු මුදල් රු.22,525,899,343 ක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, මෙම කටයුතු කඩිනම්ව ඉටුකිරීමේ | - එම- |

| | | |
|---|---|---|
| | අවශ්‍යතාව නිසා මුදල් අමාත්‍යාංශයේ කළමණාකරණ විගණන කමිටුවේ උපදෙස් මත, මේ සම්බන්ධයෙන් ජාතික අයවැය, කළමනාකරණ විගණන හා ශ්‍රී ලංකා රේගුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර ඇත. ඒ මඟින් හිඟ රේගු බදු මුදල් අයකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | |

## 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

### 2.2.1 මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වියදම් වැය විෂය 03 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර සියයට 17 සිට සියයට 22 දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය විය. | රේගු නිලධාරීන්, දිවයින පුරා විවිධ රේගු උප කාර්යාල වල සේවය කරනු ලබන අතර දෙපාර්තමේන්තු ස්ථානමාරු ක්‍රමවේදය යටතේ මෙන්ම විවධ රාජකාරී අවශ්‍යතා සඳහා සිදුකරනු ලබන ගමන් වෙනුවෙන් සංයුක්ත දීමනා හා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කළයුතුවේ. මධ්‍යගත ගෙවීම් ක්‍රමය යටතේ ගෙවීම් සිදුකරනු ලබන බැවින් වවුචර්පත් ප්‍රධාන කාර්යාලය වෙත එවීමේදී ප්‍රමාදවීම් සිදුවේ. ඒ අනුව සෑම වර්ෂයකම පෙර වර්ෂයට අදාල ගමන් වියදම් විශාල ප්‍රමාණයක් පවත්නා වර්ෂයේදී ගෙවීම් කිරීමට සිදුවේ. ඒ අනුව 2019 වර්ෂයට අදාලව 2020 වර්ෂයේදී රුපියල් මිලියන 15 කට ආසන්න මුදලක් ගමන් වියදම් ලෙස ගෙවීම් සිදුකර ඇත. තවද නවක | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | නිළධාරින් බඳවා ගැනීමද, ගමන් වියදම් ගෙවීම් අගය වැඩිවීමට හේතුවී ඇත. | |
| **(ආ)** | වැය විෂය අංක 247-1-1-0-1002 (2) අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් මූලික ඇස්තමේන්තු රු. 12,100,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.14,100,000 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තු අතර සියයට 17 ක විචලතාවයක් නිරීක්ෂණය විය. 2020 වර්ෂයේදී කොවිඩ් 19 තත්ත්වය මත නිලධාරීන් සේවයට වාර්තා නොකිරීම හා සීමා කිරීම මත බොහෝ වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරිව පැවති බව ගණන්දීමේ නිලධාරීන් ප්‍රකාශ කර තිබියදී අතිකාල ගෙවීමේ වැය විෂයය පෙර වර්ෂයට වඩා ඉහළ යාම විගණනයේදී ප්‍රශ්න ගත විය. | නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම නිසා සාපේක්ෂව අතිකාල වෙනුවෙන් වූ වියදම වැඩිවී ඇති අතර කොවිඩ් 19 තත්වය මත නිලධාරීන්ගේ පැමිණීම සීමා කළ කාලසීමාවන් වලදී අතපසු වූ රාජකාරී ඉටු කිරීම සඳහා සීමාවන් ඉවත්කළ කාලයේදී නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීමට සිදුවිය. | වැය විෂයයක් සඳහා ගෙවීම් කිරීමට පූර්ව අනුමැතිය ලබා දීමේදී විචක්ෂණශීලී ලෙස කටයුතු කිරීම. |
| (ඇ) | වැය විෂය අංක 247-1-1-0-1101 දේශීය ගමන් වියදම් සඳහා මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 20 ක විචලතාවයක් නිරීක්ෂණය විය. එසේම එම වැය විෂයයන් සඳහා ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුව රු.67,500,000 ක් වූ අතර 2020 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව රු.90,800,000 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුළ රු.23,300,000 ක් ඇස්තමේන්තුව වැඩිවී තිබුණි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ බොහෝ | ප්‍රායෝගික ගැටළු මත දිගින් දිගටම පෙර වර්ෂ වල ගමන් වියදම් වෙනුවෙන් පවත්නා වර්ෂයේ දී ගෙවීම් කිරීමට සිදු වීම මත 2020 වර්ෂයේද ඇස්තමේන්තුගත මුදලට වඩා ගමන් වියදම් ගෙවීමට සිදුවිය. සේවයට කැඳවූ නිලධාරීන්ගේ සංඛ්‍යාව අඩු කළ කාලසීමා වලදී වුවද නිලධාරීන්ගේ ගමන් වාර ගණන වැඩි වීම මත ද වියදම් වැඩි වී ඇත. අත්‍යාවශ්‍ය රාජකාරී ඉටු කළ මෙම දෙපාර්තමේන්තුවේ සරප් රාජකාරී ඇතුළු වෙනත් විවිධ අත්‍යාවශ්‍ය රාජකාරී වල නිරත වූ නිලධාරීන් සීමා පැණවීම් යටතේ වුවද රාජකාරියේ යෙදවීමට සිදු වීම මත ද මෙම වියදම් වැඩිවී ඇත. | -එම- |

වැය විෂයයන් ඉතිරිව පැවතිය ද දේශීය ගමන් වියදම් වෙනුවෙන් වියදම අසාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කිරීම විගණනයේදී ප්‍රශ්නගත විය.

**2.2.2 ප්‍රතිපාදන ඉතිරිවීම**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** පුනරාවර්ථන වියදම | | |
| වැය විෂයන් 07 ක ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 09 සිට සියයට 18 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ ඒ අනුව පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රු.3,416,000,000 ක් වෙන්කර තිබූ අතර එයින් සියයට 20 ක් ලෙස රු. 697,476,786 ක් ඉතිරිව පැවතුනි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කල යුතු බව. |
| **(ආ)** මූලධන වියදම | | |
| සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම වෙනුවෙන් රු.162,200,000 ක් වෙන්කර තිබූ අතර එයින් සියයට 63 ක් ඉතිරිව පැවතුණි. ඒ අනුව වැය විෂයයන් 10 ක ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 09 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි<br>2020 වර්ෂයේදී අතුරු සම්මත ගිණුම මඟින් කිහිප අවස්ථාවක දී ප්‍රතිපාදන ලබා දීම හේතුවෙන් සහ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් කළමනාකරණය කර ගැනීමට අපහසු විය. | -එම- |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**2.3.1 බැඳීම් හා බැරකම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 10 කට අදාලව සමාලෝචිත වර්ෂය තුල එළැඹ තිබූ එකතුව රු.26,623,190 ක් වූ බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිතවල ඇතුළත් වී නොතිබුණි. | අංක **247-1-1-0-1403** වැය විෂයය හැර අනිකුත් වැය විෂයයන් සම්බන්ධව නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.<br>05/2020 දරන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත පසුව වාර්තා කළ අගය — රු. 4,069,204<br>CIGAS වැඩසටහන මඟින් වාර්තා කළ (භාණ්ඩාගාර මුද්‍රිත වල ඇතුලත්) බැඳීම් හා බැරකම් — රු. 7,523,372<br>සටහන III අනුව බැඳීම් හා බැරකම් — රු.11,592,576 | නිවැරදිව ගිණුම් වාර්තාකරණය කල යුතු බව. |
| (ආ) | වැය විෂයයන් 05 ට අදාලව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා බැරකම් ප්‍රකාශය අතර රු.46,524,640 ක වෙනසක් නිරීක්ෂණය විය. | 1002,1003,1101,1202 හා 1409 යන වැය විෂයයන් සම්බන්ධව නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. එසේ වුවද 1403 වැය විෂයයට අදාල තොරතුරු පහත පරිදි වේ.<br>සටහන III අනුව බැඳීම් හා බැරකම් — රු.11,592,576<br>CIGAS වැඩසටහන මඟින් වාර්තා කළ (භාණ්ඩාගාර මුද්‍රිත වල ඇතුලත්) බැඳීම් හා බැරකම් — රු. 7,523,372 | - එම - |
| (ඇ) | අවසන් ගිණුම තුළ පෙන්වා ඇති නමුත් 2020 වර්ෂයේ අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් ලේඛනවල වගකීම් ලෙස දක්වා නොමැති වගකීම්වල වටිනාකම රු. 47,628,444 ක් විය. | විගණනය විසින් පෙන්වාදී ඇති බිල්ඩින් මේන්ටෙනස් ආයතනය නමින් සඳහන් රු.2,650,644 ක මුදල බැරකම් ලේඛන වල ඇතුලත්වේ.<br>ඉතිරි වටිනාකම් බැරකම් ලෙස හඳුනාගෙන වාර්තා කර ඇතත් බැරකම් ලේඛනයට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනයක් සමඟ බහාලුම් පරිලෝකන ව්‍යාපෘතියක් වෙනුවෙන් ඇති කරගත් ගිවිසුමකට අනුව ගෙවිය යුතු රු. 587,725,600 ක මුදලක් ප්‍රශ්න ගත තත්ත්වයක් යටතේ පවතින බැවින් එම මුදල ආයතනයේ බැදීමක් හෝ වගකීමක් ලෙස ගිණුම් තුළ පෙන්වා නොතිබුණි. | බහාලුම් පරිලෝකන ව්‍යාපෘතිය රජයට පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින අතර, එම කටයුතු නිමා වන තුරු අදාළ ගෙවීම් සිදුකර නැත. අදාළ අනුමැතින් අමාත්‍ය මණ්ඩලයෙන් ලද පසු ඉදිරි කටයුතු සිදු කල හැකිය. | ගිණුම් සැකසීමේදී රාජ්‍ය අංශ ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කල යුතු බව. |
| (ඉ) | වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැදීම් හා බැරකම්වලට එළැඹීම වළක්වාලීමේ අරමුණින් යුතුව බැදීම් හා බැරකම් සම්බන්ධ තොරතුරු පද්ධතිය පවත්වා ගැනීමත්, දිනපතා තොරතුරු භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත්, දෙපාර්තමේන්තු තොරතුරු සමඟ භාණ්ඩාගාර තොරතුරු සැසඳීමේ අවශ්‍යතාවයන් අවධාරණය කරමින් විවිධ උපදෙස් හා මාර්ගෝපදේශයන් ඇතුලත් කර භාණ්ඩාගාරය විසින් වරින් වර බොහෝ චක්‍රලේඛයන් නිකුත් කර ඇත. එහෙත් එම චක්‍රලේඛයන්ට අනුකූලව ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉහත (අ) පිළිතුර වෙත අවධානය යොමු කරමි. | භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූළව කටයුතු කල යුතු බව. |

## 2.3.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට පටහැනිව 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 03 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු.2,908,508 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි. | ඇතැම් බැරකම් පිළිබඳ තොරතුරු ගිණුම් වර්ෂය අවසන් වීමෙන් පසුව හඳුනා ගැනීමට සිදු වන බැවින් සහ ඒ වන විට අදාල සේවාවන් ද ලබා ගෙන ඇති බැවින් ගෙවීම් කිරීමට සිදු විය. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළැඹීමට වගබලා ගත යුතු බව. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් අංශයට අදාළව මු.රෙ. 135 යටතේ බලතල පැවරීම, ගනුදෙනුවල නිලධාරීන් කිහිපදෙනෙකු අතර වගකීම් පැවරෙන අයුරින් රාජකාරි පැවරීම වැනි මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබයි. කෙසේ වුවද ඉදිරියේදී විගණන පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2019 අප්‍රේල් 04 දිනැති අංක 2117/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (අ), (ආ) ඡේද | ගැසට් පත්‍රය අනුව සහ යෝජිත බදු සහනය යටතේ ශ්‍රී ලංකා රේගුවෙන් නිශ්කාෂණය කරගනු ලබන සියලුම මෝටර් රථ වාහන, නිදහස් කළ දින සිට දින 30 ක් ඇතුළත දක්වා ඇති පරිදි පුද්ගලික නමින් ලියාපදිංචි කළ යුතු විය. එසේ ලියාපදිංචි නොකරන ලද මෝටර් රථ නිශ්කාෂණය කරන අවස්ථාවේදී අදාල වන නිෂ්පාදන බද්ද ගෙවිය යුතු වේ. එහෙත් 2019 සැප්තම්බර් 02 දිනැති අංක 21/215 දරන රේගු සටහන්කරයට අදාල Nissan Used Xl Trail රථය ලියාපදිංචි කිරීම මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කර තිබියදී එම වාහනය සඳහා වූ බැංකු ඇපකරය නිදහස් කිරීම නිසා රු.8,112,446 ක් වූ බදු මුදලක් රජයට අහිමි වී තිබුණි. | මේ සම්බන්ධව මාගේ අංකESD/GE/3/16/2020 හා 2020.09.26 දිනැති විගණන විමසුම මඟින් ලබාදී ඇති පිළිතුර මෙයට අදාළ වේ. | අදාල ගැසට් නිවේදනයේ සඳහන් නීතිරීති වලට අනුකූලව කටයුතු කල යුතු බව. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) XXVIII පරිච්ඡේදයේ 1.3 ඡේදය | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් අදාල අංශයන් විසින් පවත්වාගෙන යනු ලබන පැමිණීමේ ලේඛන නිතිපතා මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි. | අධීක්ෂණය කිරීම් කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ XXVIII ප්‍රකාරව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ii) XXIV පරිච්ඡේදයේ 04 වන ඡේදය | • වර්ෂ 01 ට අඩු රු.443,490,830 ක් හා වර්ෂ 05 ට වැඩි රු.531,766 ක් වූ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ 01 ට අඩු විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂය වන රු. 4,466,381 න් රු.3,147,273 මුදලක් 2021 වර්ෂයේ මේ දක්වා නිරවුල් කර ඇත.<br>එසේම, වර්ෂ 05 ට වැඩි විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවීමට ඇති ණය ශේෂ යටතේ රු.10,000 ට අඩු නිරවුල් නොවූ ණය ශේෂ රු.32,050 මුදලක් පොත් වලින් ඉවත් කිරීමට ඉල්ලා ඇත. මු.රෙ. 109 යටතේ අලාභයන් පොතෙන් කපා හැරීම සඳහා මුදල් අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ අංක MF1/02/01/cus/53 හා 2021.02.10 දිනැති ලිපියෙන් (පොදු 285) අනුමැතිය ලැබී ඇත.<br>ඒ අනුව, එම රු.531,766 න් රු.11,041 මුදලක් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ XXIV ප්‍රකාරව කටයුතු කිරීම. |
| | • වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 1 ට අඩු රු. 444,151 ක්ද, වර්ෂ 03 ත් 04 ත් අතර රු. 68,800 ක්ද, වර්ෂ 04 ත් 05 ත් අතර රු. 106,220 ක්ද, වර්ෂ 05 ට වැඩි 1,411,666 ක්ද වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු රු.1,411,666 න් රු.20,009 ක මුදලක් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>වර්ෂ 01ට අඩු වැඩ තහනම් කළ නිලධාරින්ගේ විමර්ෂණ කටයුතු දැනට සිදුවෙමින් පවති. එබැවින් එම පරීක්ෂණ අවසාන වූ පසු එම රු.444,151 මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සියලුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර පැමිණීම සහ පිටවීම සටහන් කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ කිසිදු නිලධාරියෙකු එසේ කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලවල, වරාය හා ගුවන්තොටුපල ආදී ස්ථානවල අදාළ අංශභාර අධීක්ෂණ නිලධාරියෙකුගේ සහතික කිරීම් මත අතිකාල ගෙවීම් සිදුකර ඇත. තවද, මෙම ඇඟිලි සලකුණු තැබීම සම්බන්ධව වාර්තාවක් 2021.04.06 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) වෙත ඉදිරිපත් කර ඇත. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ඇ) මු.රෙ 485 (4) හා 2004 ඔක්තෝබර් 01 දිනැති අංක 118 දරන අයවැය චක්‍ර ලේඛයේ 1:1:6 හා 1:1:7 ඡේද | නිලධාරියෙකු ස්ථාන මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොතිබීමට වගබලා ගත යුතු වුවද ස්ථාන මාරු වී ගොස් වර්ෂ 01 ට අඩු රු. 291,181 ක්ද, වර්ෂ 05 කට අධික කාලයක් ගත වී ඇති රු. 138,551 ක්ද වශයෙන් නිරවුල් නොවූ ණය ශේෂ පැවතුණි. | ස්ථාන මාරුවී ගොස් ඇති එක් අයෙකුට අදාල ණය ශේෂය රු. 210,099 ක් 2021 පෙබරවාරි මස නිරවුල් වී ඇත.<br>තවත් අයෙකු අමාත්‍යවරයෙකුගේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස පත්වී ඇති අතර එම තනතුර අහෝසි වීමත් සමඟම ණය ශේෂය නැවත මෙම දෙපාර්තමේන්තුව වෙත වරාය සංවර්ධන හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් පවරා ඇත. වැරදීමකින් එම ණය ශේෂය වර්ෂ 01 ට අඩු තීරුවේ සටහන් වී ඇත. තවද එම නිලධාරියා ඉන්පසු මාරුවී ඇති සේවා ස්ථානය පිළිබඳ තොරතුරු සොයමින් පවති.<br>අනෙක් නිලධාරියාගේ ණය ශේෂය වරාය නාවික කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | 2019 ඔක්තෝබර් මස ගිණුම් සාරාංශය මගින් මෙම දෙපාර්තමේන්තුවේ බී ගිණුමට හර කර ඇත. එම නිලධාරියගේ තොරතුරු ද සොයමින් පවති. | |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 වන පරිච්ඡේදය | ආයතනය විසින් අවශ්‍යතා ඉක්මවා මිලදී ගෙන තිබුණු පාවහන් හා මේස් යුගලවලට අදාල ප්‍රසම්පාදන කාර්යයේදී තාක්ෂණික ඇගැයීම් කමිටුවක සහය ලබාගෙන නොතිබුණි. | මාගේ අංක ESD/GE/03/01/2021 හා 2021.05.04 දිනැති විගණන විමසුමේ 05. (අ) හා (ඇ) මඟින් මේ සඳහා ලබාදී ඇති පිළිතුරු මෙයට අදාළ වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිසි විනිවිදභාවය කින් යුතුව කටයුතු සිදු කල යුතු බව. |
| (ඊ) අංක DAM/01/2019 දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛයේ 5.1.2 ඡේදය | අභ්‍යන්තර විගණකගේ සහ විගණකාධිපතිවරයාගේ විගණන වාර්තා කෙරෙහි අවධානය යොමු කිරීම හා එම වාර්තාවලින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කර ගැනීම පිළිබඳ පසුවිපරම් කිරීම් විගණන හා කළමනාකරණ කමිටුවල කාර්යයක් වුවද නිකුත් කර ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු සකසා ගැනීම සතුටුදායක මට්ටමක නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම කරුණු සම්බන්ධයෙන් ඔබගේ අංක.PUR/A/CUS/2020/D/04 හා 2020.08.31 දිනැති විගණන විමසුම සඳහා 2020.10.06 දිනැතිව ඉදිරිපත් කරන ලද විගණන නිරීක්ෂණ කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. ඒ අනුව 2021.02.01 දින සිට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පංතියේ නිලධාරියෙකු නිත්‍ය වශයෙන් පත්කර ඇති බවත්, රජයේ විගණන අංශය මඟින් පෙන්වා දී තිබූ අඩුපාඩු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක.DMA/01/2019 දරණ චක්‍ර ලේඛය ප්‍රකාරව නිවැරදිව හා යාවත්කාලිකව පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී. | විගණකාධිපතිවරයාගේ විගණන වාර්තා කෙරෙහි නිසි අවධානය යොමු කර පෙන්වා දී ඇති අඩුපාඩු සකසා ගැනීමට නිසි පසු විපරම් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (උ) රේගු දෙපාර්තමේන්තු නියෝග 375 (3) | සියළුම අංශවල හා උප කාර්යාලවල නිලධාරීන් කාර්යාල පරිශ්‍රයෙන් බැහැර යාම සම්බන්ධයෙන් බැහැර යාමේ ලේඛනයක් නඩත්තු කිරීම හා මාණ්ඩලික නිලධාරියෙකු හෝ ස්ථාන භාර නිලධාරීන් විසින් ඒ බව අධීක්ෂණය කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | බැහැර යාමේ ලේඛණය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් සියලුම අංශ හා උප කාර්යාල වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තු නියෝග අනුව අදාල නිලධාරීන් ගේ අධීක්ෂණ කටයුතු සිදු කල යුතු බව. |
| (ඌ) ශ්‍රී ලංකා රේගුවේ බඳවා ගැනීමේ පටිපාටියේ 10.02.01.02 ඡේදය | රේගු අධ්‍යක්ෂ තනතුරට පත් කිරීමේදී සලකා බැලිය යුතු සුදුසුකම් පිළිබඳ ලබාදී ඇති උපදෙස් අනුගමනය නොකර අතිරේක රේගු අධ්‍යක්ෂ හා රේගු අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරීන් 06 දෙනෙකුට උසස් වීම් ලබාදී තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ පැවති උසස් වීමේ ක්‍රමවේදය අනුව පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්හිදී නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගෙන එකී අනුපිලිවෙලට උසස්වීම් ලබාදී ඇත. පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APP/6/679/2016 හා 2017.05.02 දිනැති ලිපියෙන් 1979.10.15 දින දක්වා සේවයට බඳවා ගත් නිලධාරීන් සඳහා පමණක් විධායක i ශ්‍රේණියට බඳවා ගැනීමේ පිටිපාටියේ 10.2.1.2 හි (1) වගන්තියෙන් බැහැරව ක්‍රියා කිරීමටද ඉන් ඉදිරියට බඳවා ගත් නිලධාරීන් වෙත උසස්වීම් ලබාදීමේදී බඳවා ගැනීමේ සඳහන් අනෙකුත් කොන්දේසි සහ සුදුසුකම් සමඟ බඳවා ගැනීමේ පරිපාටියේ 10.2.1.2. හි (1) අවශ්‍යතාවයද සළකා විධායක i ශ්‍රේණියට උසස් කළයුතු බව ද දන්වා ඇත. ඒ වනවිටත් ජ්‍යෙෂ්ඨත්වය අනුව නිලධාරීන් විධායක i ශ්‍රේණියට වැඩ බැලීමේ පදනමින් පත්කර තිබුනද විධායක i ශ්‍රේණියට | දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පටිපාටියේ නියමයන් අනුගමනය කල යුතු බව. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් උසස්වීම් ලබාදීමේදී නිර්දේශ ඉදිරිපත් කර ඇත්තේ මෙකී කරුණු සැලකිල්ලට ගනිමිනි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

-------------------

මේ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු විමර්ශනයකට අදාලව අනිවාර්ය නිවාඩු ගන්වා තිබූ නිලධාරියෙකු විදේශ ගතවීම වලක්වා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව විදේශ ගතව තිබූ බව නිරීක්ෂණය විය. | තොරතුරු සොයා බලමින් පවතී. | විදේශ ගතවීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම. |
| (ආ) | 1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින්, ත්‍යාග වශයෙන් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝග සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 22 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු. 19,748,129,578 ක් ගෙවා තිබුණි. | ත්‍යාග මුදල් ගෙවීම සම්බන්ධව 1869 අංක 17 දරණ රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තියට අනුව ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ නොවෙමි. 1988 වර්ෂයේ අංක 118 දරන දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කිරීමේ දී අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය නිකුත් කර ඇතැයි යන්න උපකල්පනය කළ හැකි අතර තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු වේ.<br><br>ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගැනීම මුදල් අමාත්‍යාංශය වෙතින් කමිටුවක් පත් කර ඇත. | අමාත්‍යවරයාගේ අනුමැතිය දැක්වෙන ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් කිරීම.<br>අනුමත ක්‍රියාපටිපාටියක් නොමැති නම් එසේ සිදු කල නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | විධිමත් අවසරයකින් තොරව රටින් බැහැරව ගෙන යාමට උත්සාහ කළ ඇ.ඩොලර් 53,455 ක මුදල රේගුව විසින් රඳවා ගෙන තිබූ අතර මුදල් අමාත්‍යවරයාගේ ඉල්ලීම මත (රේගු ආඥා පනතේ 164 වගන්තිය යටතේ) සාධාරණ කරුණු දැක්වීමකින් තොරව මෙම මුදල නැවත ලබාදීමට කටයුතු කර තිබීම හේතුවෙන් සිදුව තිබූ රු.1,603,650 ක පාඩුවේ වටිනාකම මු.රෙ. 106 හා 113 යටතේ වන පාඩු ලෙස සටහන් කර තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | රේගු ආඥා පනතේ 164 වගන්තිය අනුව රඳවාගත් භාණ්ඩ හා වෙනත් දේපල නිදහස් කිරීමට අමාත්‍යවරයාට බලය තිබුණද, අලාභ හෝ වෙනත් පිරිවැය දැරීම සඳහා බලය ලබා දී නොමැත. ඒ අනුව අලාභය / වැඩිපුර ගෙවීම් කිරීම නීත්‍යානුකූළ නොවන බව. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

-----------------------------------

මේ සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව යම් විශේෂිත කාර්යයක් සඳහා ලබාගන්නා අතුරු අග්‍රිම කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, නිලධාරීන් 17 දෙනෙකු විසින් අවස්ථා 23 කදී ලබාගත් රු.1,746,850 ක අත්තිකාරම් පියවීමට දින 33 සිට දින 313 දක්වා කාලපරාසයක් ගත කර තිබුණි. | ඔබේ අංක PUR/A/CUS/2020/11 දරන විගණන විමසුමට පිළිතුරු වශයෙන් යොමු කළ මගේ අංක ESD/GE/03//04/2021දරන 2021.05.11 දිනැති ලිපියේ 01 ඡේදය මඟින් පිළිතුරු ලබා දී ඇත (ඇමුණුම 02). | මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගත යුතු බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිමයේ උපරිමය වූ රු.100,000 ක සීමාව ඉක්මවා නිලධාරීන් වෙත අත්තිකාරම් ලාබදී තිබුණි. | උක්ත ලිපියේ 04 ඡේදය මඟින් පිළිතුරු ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත් දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මහජන බැංකු ගිණුම් අංක 001-1-001-2-9026644** | | |
| (i) 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වලංගු කාලය මාස 06 ඉක්මවූ එකතුව රු.125,631 ක් වූ චෙක්පත් පවතින බව නිරීක්ෂණය විය. මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එදිනට වලංගු කාලය මාස 06 ඉක්ම වූ චෙක්පත්වල වටිනාකම රු.1,882,260 කි. 2021 අප්‍රේල් මස 30 දිනට මෙම චෙක්පත්වලින් රු.1,756,628 ක වටිනාකමක් ඇති චෙක්පත් ප්‍රමාණයක් නිෂ්කාශනය වී ඇත. ඉතිරිව පවතින්නේ රු.125,631 ක චෙක්පත් පමණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ii) 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් හා හඳුනා නොගත් ගෙවීම් ශේෂ ලෙස පිළිවෙලින් රු.148,523 ක් හා රු. 153,243 ක බැංකු සැසඳුමේ දක්වා තිබුණු අතර එම ශේෂයන් හඳුනාගෙන ගිණුම් ගත කලේ ද යන්න තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු.148,523 ක් වන අතර හඳුනා නොගත් ගෙවීම් රු.153,243 ක් විය. | අදාල ශේෂයන් හඳුනාගෙන විගණනය වෙත ඉදිරිපත් කල යුතු බව. |
| **(ආ) ලංකා බැංකු ගිණුම් අංක 0007041606** | | |
| (i) 2020 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම තුළ වලංගු කාලය මාස 06 ක් ඉක්ම වූ රු.466,415 ක් වූ චෙක්පත් පවතින බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට රු.466,415 ක වටිනාමක් ඇති චෙක්පත් පමණක් ඉතිරිව පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| (ii) 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් ශේෂයන් ලෙස පිළිවෙලින් එකතුව රු.1,238,868 ක් හා රු. 2,726 ක් බැංකු සැසඳුමේ දක්වා තිබුණු අතර එම ශේෂයන් හඳුනාගෙන ගිණුම් ගත කලේ ද යන්න තහවුරු කිරීමේ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු.1,224,852 ක ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.<br>එසේම, 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ගෙවීම්වල ශේෂය වන රු.2,726.00 ක ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | අදාල ශේෂයන් හඳුනාගෙන විගණනය වෙත ඉදිරිපත් කල යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය සිදුකළ රේගු විමර්ශනයකින් අනතුරුව විනාශ කිරීමට නිර්දේශ කර තිබූ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ආනයනික පාම් ඔයිල් කිලෝග්‍රෑම් 105,570 ක් අඩංගු බහාළුම් 05 ක් විනාශ කළ බවට ව්‍යාජ තොරතුරු ලේඛනවල ඇතුළත් කරමින් ඒවා ගබඩා කර තැබීම හා එයින් කොටසක් වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධ විමර්ශනයේදී එම විමර්ශනය මෙහෙය වූ මධ්‍යම අපහරණ අංශයේ නිලධාරීන් එම අංශය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණින් බැහැරව කටයුතු කර තිබුණු බව අනාවරණය වි තිබුණි. රේගු විමර්ශන සිදු කිරීම මෙන්ම එම විමර්ශනයන් සිදු කළ අංශය භාරයේ තිබූ භාණ්ඩ විනාශ කිරීම හෝ විකිණීම යන කාර්යයන්ද එම අංශය මඟින්ම සිදු කිරීමට ඉඩ සලසා දී තිබීම ලබාදීම තුළින් | මෙම බහාලුම් 05 වරායෙන් ඉවත් කිරීම මඟින් රජයට පාඩු සිදුවී නොමැත.<br>එහි සඳහන් බහාලුම් 05 සම්බන්ධයෙන් මධ්‍යම විමර්ශන අංශය විසින් CIB/INV/230/2019 දරණ විමර්ශන ගොනුව යටතේ විමර්ශනයක් සිදු කරමින් පවතින අතර, එම බහාලුම් 05න් 04ක් දැනටමත් අත්අඩංගුවට ගෙන ඇත. ඒවායේ අඩංගු<br>Crude Farm Oil සත්ව ආහාර සෑදීම සඳහා යෝග්‍ය බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති බැවින්, මෙම බහාලුම් 04 අඩංගු Crude Farm Oil රේගු ආඥා පනතේ162 වගන්තිය අනුව, ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය මඟින් සත්ව ආහාර නිෂ්පාදනය සහ විකිණීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා මෙම බහාලුම්වල අඩංගු තෙල්වල වටිනාකම නිර්ණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ මිල පිරික්සුම් අංශය වෙත අදාළ සාම්පල යොමු කර ඇත. | රේගු ආඥා පනත හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම.<br>අදාල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | සංවිධානාත්මකව අක්‍රමිකාතවයන් සිදු කිරීම සඳහා අවස්ථාව සැලසී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම එකී අංශය විසින් ආනයනකරු පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි බව සඳහන් කරමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර විමර්ශන සම්බන්ධ අවසන් වාර්තාව මධ්‍යම අපහරණ අංශයේ රේගු අධ්‍යක්ෂවරයා වෙත යොමු කර නොතිබුණි. අදාල අංශයේ රේගු අධිකාරිවරයා හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයා විසින් මෙම විමර්ශනයේ අවසන් තීරණය ගෙන තිබුණි. | මෙම විමර්ශනය අවසානයේදී රේගු ආඥා පනතේ 8.1 වගන්තිය අනුව පැවැත්වීමට නියමිත රේගු පරීක්ෂණයේදී රජයට යම්කිසි පාඩුවක් සිදුවී ඇත්නම්, රේගු පරීක්ෂණය පවත්වනු ලබන පරීක්ෂණ නිලධාරියාගේ නියෝග මත එම පාඩුව වරදකරුවන්ගෙන් අයකර ගැනීමට හැක. | |
| (ආ) | මහජන ඇමතුම් උපකරණ සවිකර ආනයනය කර තිබු රු.මිලියන 9 කට ආසන්න වටිනාකමකින් යුතු සුඛෝපභෝගී Toyota Land Cruiser මාදිලියේ වාහනයක් විශේෂ කාර්යය වාහන කණ්ඩය යටතේ රු.මිලියන 1.5 ක බද්දක් පමණක් අයකරගෙන නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුව කටයුතු කර තිබුණි. මෙම මාදිලියේ වාහන මගී ප්‍රවාහන කණ්ඩය යටතේ නිශ්කාෂණය කලේ නම් රු.මිලියන 56 කට ආසන්න බද්දක් අයවිය යුතුව තිබුණි. ඒ හේතුවෙන් රජයට රු.54,642,528 ක බදු ආදායමක් අහිමි වී තිබුණි. | Toyota Land Cruiser වාහනය සම්බන්ධව මධ්‍යම විමර්ශන අංශය විසින් අංක CIB/INV/2019/0206 යටතේ රේගු විමර්ශනයක් ආරම්භ කරන ලද අතර, එම විමර්ශනයේදී නිවැරදි රේගු භාණ්ඩ සංයෝජිත අංක ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුවේ (Nomenclature & Classification Committee ) වෙත යොමු කර ඇත. එම කමිටුව විසින් වර්ගීකරණය අංකය ලෙස 87059091 වශයෙන් නිගමනය කර ඇත. එම තීරණය මත එම වාහනය ආනයන කරු වෙත මුදාහැර ඇත. එබැවින්, NC කමිටු තීරණය අනුව එබඳු බදු ආදායමක් අහිමි වී නොමැත. | අයවිය යුතු නියමිත ආදායම අයකර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට කටයුතු කල යුතු බව.<br>ශ්‍රී ලංකා රේගුවේ **NC** කමිටුව සඳහා රේගු ආඥා පනතින් ලබාදී ඇති බලය, කමිටුව සාමාජිකයින්ගේ තීරණවලට එරෙහිව අභියාචනා බලය හා **NC** කමිටු කාර්යභාරය විධිමත් හා විනිවිදභාවයකින් සකස් කල යුතු බව. |

## 3.2 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) JAIKA ආධාර මත DI පයිප්ප හා උපාංග ගෙන්වීම** | | |
| (i) රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පෞද්ගලික ආයතනයක් වෙත අවස්ථාව ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු විය. එහෙත් දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර තිබුණි. එමගින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සලසා තිබුණි. | මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කළ විශේෂ කමිටුවක් මගින් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර සැනටමත් ගෙන ඇත. එම නිර්දේශ අනුව , රේගු ආඥා පනතේ 72 හා 86 වගන්ති අනුව ක්‍රියා කිරීම.<br>ගුදම් රාජකාරි සේවයේ නිරත නිලධාරීන්ට අදාළ ක්‍රියාපටිපාටිය පිළිබඳ පැහැදිලි උපදෙස් ඇතුලත් නිශ්චිත දෙපාර්තමේන්තු නියෝග ලබා දීම<br>භාණ්ඩ සාමාන්‍ය ගුදම්ගත කිරීමට අවසර ලබා දීමේ ලිඛිත ක්‍රමවේදයක් සැකසීම, රාජ්‍ය ආයතන විසින් විවිධ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමේදී විදේශ විනිමය භාවිතා කොට ගෙවීමට එකඟ විය යුත්තේ සත්‍ය වශයෙන්ම එම භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැයවූ CIF වටිනාකම පමණක් ලෙස සැලකීම වැනි පියවර ගෙන ඇත. | රේගු ආඥා පනත උල්ලංඝනය කිරීම, දේශීය ඉන්වොයිසීන් පිළිගැනීම, ආනයනකරුවන්ට අයුතු ලාභ ලබා ගැනීමට අනුබල දීම, රේගු විමර්ශනයන් නිවැරදිව සිදු කිරීම රජයේ ආයතනයක් නොමඟ යවා අලාභ ඇති වන කටයුතු කිරීම සම්බන්ධව නිසි පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| (ii) ගුදමට භාණ්ඩ භාරගැනීමේදී ගෙවිය යුතුව තිබූ බදු ගණනය රු.263,301,203 ක් වුවද, ගුදමෙන් භාණ්ඩ නිදහස් කිරීමේදී බදු ගණනය රු.325,800,859 ක් ලෙස පෙන්වා තිබූ බැවින් ශ්‍රී ලංකා රජයට රු.62,499,656 ක බදු මුදලක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. | -එම- | - එම - |
| (iii) ව්‍යාජ ඉන්වොයිස් සැකසීම, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර විදේශීය මෙන්ම දේශීය මුදල්ද ලබාගෙන තිබියදී මේ සම්බන්ධ විමර්ශන සිදු කරන ලද ශ්‍රී ලංකා රේගුව විසින් අදාල ආයතනය විසින් වරදක් කර නොමැති බව සලකා විමර්ශන අවසන් කිරීම විගණනයේදී ප්‍රශ්ණගත විය. | -එම- | - එම- |

**(ආ) රේගු විමර්ශන සම්බන්ධ කාර්යය සාධනය**

| | | |
|---|---|---|
| (i) 2015 ජනවාරි 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රේගුවේ විවිධ අංශයන් විසින් රේගු විමර්ශන 25,674 ක් ලියාපදිංචි කර තිබූ අතර මෙම විමර්ශනවලින් සියයට 26 ක් හෙවත් 6716 ක ප්‍රමාණයක් විගණිත දිනය වූ 2020 සැප්තැම්බර් 22 වන විටත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉන් විමර්ශන 1090 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද, විමර්ශන 928 ක් වර්ෂ 04 ත් 05 ත් අතර කාලයක්ද, විමර්ශන 942 ක් වර්ෂ 03 ත් 04 ත් අතර කාලයක්ද, විමර්ශන 900 ක් වර්ෂ 02 කට වැඩි කාලයක්ද, විමර්ශන 1285 ක් වර්ෂ 01 | මෙම ඡේදයන්හි සඳහන් කරුණු සමඟ එකඟවිය නොහැකි බව දන්වන අතර, එම විගණන විමසුම සම්බන්ධයෙන් මධ්‍යම විමර්ශන අංශය විසින් සකස් කර මගේ අංක. ESD/GE/03/02/2021 හා 2021.04.20 දිනැති වාර්තාව මඟින් ඒ සඳහා පිළිතුරු ලබාදී ඇත. | රේගු විමර්ශන ආරම්භ කිරීමට ප්‍රමාදයන් සමාලෝචනය කිරීම හා විමර්ශන කටයුතු අවශ්‍ය කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම.<br>රේගු විමර්ශන දත්ත අතර වෙනස්කම් පෙන්වීම තුලින් මූලික දෝෂය නිවැරදි නොවන අතර විමර්ශන දිගු කලක සිට අවසන් නොකිරීම සොයා බලා ඒ සම්බන්ධව නිසි පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| ට වැඩි කාලයක් ද ලියාපදිංචිය පමණක් සිදු කර පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. 2020 වර්ෂය තුළදී ආරම්භ කර ලියාපදිංචිය පමණක් සිදු කර තිබූ විමර්ශන සංඛ්‍යාව 1571 ක් විය. | | |
| (ii) රේගුවේ විවිධ අංශ විසින් විමර්ශන කටයුතු නිම කර රේගු මධ්‍යම විමර්ශන ලියාපදිංචි පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා මධ්‍යම විමර්ශන අංශය වෙත වාර්තා කර තිබූ විමර්ශන 1285 ක් වෙනුවෙන් විගණන දිනය වූ 2020 සැප්තැම්බර් 22 දින වන විටත් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අතරින් සියයට 70 ක් හෙවත් විමර්ශන 903 ක් සඳහා ගත කර තිබූ කාලය වර්ෂ 03 සිට 05 දක්වා විය. විමර්ශන 17672 ක විමර්ශන කටයුතු අවසන් කර තිබුණ ද එයින් විමර්ශන 9573 ක් හෙවත් සියයට 54 ක්ම කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව අවසන් වී තිබුණි. | -එම- | -එම- |

**4. මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පඩිනඩි කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1925 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. මිලියන 0.8 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පුරප්පාඩු 685 පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | **(i)** අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නියමිත අනුමැතිය මත බඳවා ගැනීම<br>**(ii)** අනවශ්‍ය තනතුරු භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අහෝසි කිරීම.<br>**(iii)** දැනට ශ්‍රී ලංකා රේගුව විසින් අසාමාන්‍ය ලෙස නිලධාරීන්ට ගෙවන අතිකාල ගෙවීම් පාලනය කර රැකියා නොමැති පුරවැසියන් සඳහා අවස්ථා ලබාදීම. |